මුදල් අමාත්‍යාංශය

# නව රේගු පනතක් සකස් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙස කරන ආරාධනය

2016 වර්ෂයේ අයවැයහි අංක 604 දරන යෝජනාවට අනුකූලව මුදල් අමාත්‍යාංශය විසින් ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේද උපදෙස් පරිදි නව රේගු පනතක් සකස් කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත.

මෙම නව රේගු පනත සකස් කිරීම වෙනුවෙන් මෙහෙයුම් කමිටුවක්, ආයතනික මට්ටමේ තාක්ෂණික කමිටුවක් සහ අදාල යෝජනා කෙටුම්පත් කිරීමසඳහා කෙටුම්පත් කමිටුවක්ද මේ වන විට පත් කර ඇත.

මෙම නව පනතට ඇතුළත් වීමට සුදුසු ලිඛිත යෝජනා සහ නියෝජනයන් ලබා දෙන ලෙස මුදල් අමාත්‍යාංශය විසින් මෙමගින් ආරාධනා කරනු ලැබේ.ඒ අනුව ලැබෙන ඵලදායි යෝජනා / ඉදිරිපත් කිරීම් හා නියෝජන නව රේගු පනත සකස් කිරීමේ කටයුතු සඳහා අදාල කර ගැනීමට සලකා බලනු ලැබේ.

යෝජනා ඉදිරිපත් කිරිමේදී ජාත්‍යන්තර වෙළඳ ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා, වෙළඳාම් පහසුකරණය, රේගු පරිපාලන වඩාත් විධිමත් කිරීම සහ අදාල අනෙකුත් කරුණු සම්බන්ධයෙන් රජයේ ආයතන, වෘත්තිය සමිති, වෘත්තීයමය සංවිධාන, බුද්ධිමතුන්, අධ්‍යනඥයින් සහ පෞද්ගලිකවඋනන්දුවක් දක්වන පුද්ගලයින්ට තම යෝජනා, අදහස් හා නියෝජන ලබා දිය හැකිය. මෙම සියළුම යෝජනා සහ ඉදිරිපත් කිරීම් පහත සඳහන් තොරතුරු ඇතුලත් වන ආකාරයට "ලිඛිතව" ඉදිරිපත් කළ යුතුය.

අ) අදාළ යෝජනා / ඉදිරිපත් කිරීම් ඉදිරිපත් කරන්නන්ගේ නම, ලිපිනය සහ දුරකථන අංකය.යෝජනා ඉදිරිපත් කරන්නේ වෘත්තිය සමිති / වෘත්තීයමය සංවිධාන / රජයේ ආයතන වන්නේ නම් එකී සංවිධානයේ නම, ලිපිනය සහ දුරකථන අංකය.

ආ) යෝජනාවේ ප්‍රධාන අදහස් පැහැදිලිව සඳහන් කළ යුතුය.

සියළුම යෝජනා / ඉදිරිපත් කිරීම් පහත ලිපිනයට 2016 .07.11 දින හෝ ඊට පෙරලැබෙන සේ එවිය යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01

වැඩි විස්තර සඳහා දුරකථන අංකය 011 2484599 මඟින් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ ජී.ඩී.එස්.පී. කුමාර මයා විමසන්න.

**මෙම ජාතික කර්තව්‍යට අත්වැල් බැඳ ගමු!**

ලේකම්,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01.